# මිනිසා පිළිබඳ බෞද්ධ සංකල්පයේ අධ්‍යාපනමය අගය විමසීම.

මහකුඹුක්ගොල්ලෑවේ රතනපාල හිමි.
අධ්‍යාපනවේදී (ගෞරව)
91 / M. Phil / 40

UCLIB
463212

කොළඹ විශ්ව විද්‍යාලයයේ
අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති පශ්චාත් උපාධිය සඳහා
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය.

463212

1996 ජූනි

*V.V.Rekha*

University of Colombo
Library

## සාරාංශය.

අනාදිමත් කාලයක සිට මිනිසා මුහුණ දී සිටින ප්‍රබල ගැටලුව නම්, තමා සහ තමා අවට විෂය ලෝකය අර්ථ සම්පන්න අයුරින් අවබෝධ කර ගැනීම පිළිබඳ ගැටලුවයි. මිහිතලය මත ජනිත සත්වයින් අතර, උස්සතම සත්වයා මිනිසායි. අන් කිසිදු සත්වයෙකුට නොමැති, මිනිසාට පමණක් සුවිශේෂී වූ ශක්‍යතාවක් මිනිසා සතුය. එනම් තමාත් තමා අවට විෂය ලෝකයත් පාලනය කරමින් තමාට රිසි අයුරින් ලෝකය වෙනස් කිරීමට සමත් අසීමිත චින්තන හැකියාවයි. දිගු කලක සිට ම ඔහු මිනිසා කවරෙක් ද යන ගැටලුව ගවේෂණාත්මක ව නිරීක්ෂණය කිරීමට බොහෝ ප්‍රයත්න දැරිය.

ආදි ම යුගයේ මිනිසා තමා අවට විෂය ලෝකයට දේවත්වයක් ආරෝපණය කළේය. ස්වභාව ධර්මයේ සමස්ත සිදුවීම් ක්‍රියාවලිය ම කිසියම් අදෘශ්‍යමාන බලවේගයක් විසින් මෙහෙයවනු ලැබේ යයි සළකා එම ස්වාභාවික සංසිද්ධි දේවත්වයෙන් සළකා වැදුම් පිදුම් කළේය. මිනිසා ද එම අදෘශ්‍යමාන බලවේගයේ සජීවී නිර්මාණයක් යයි විශ්වාස කළේය. බුද්ධ කාලීන භාරතයේ ජීවත් වූ බ්‍රාහ්මණයෝ එම අදෘශ්‍යමාන බලවේගය 'බ්‍රහ්මන්' යනුවෙන් නම් කළහ.

මිහිතලය මත ජනිත සෑම මිනිසෙකු ම මීට පෙර ආත්මභාව එකක හෝ කීපයක උපත ලබා ඇති බවත් එහිදී ඔහු එක් රැස් කළ පූර්ව භවික අත්දැකීම් හෙවත් කුසලාකුසල කර්මවල බලයෙන් මෙලොව ජනිත ව ජීවත් වන බවත් ඇතැමෙක් ප්‍රකාශ කළහ. තවත් කෙනෙක් ප්‍රකාශ කළේ මිනිසා මෙලොව ජනිත කරවිය හැකි කිසිදු ශක්ති විශේෂයක් නොමැති බවයි.

ගැඹුරින් සළකා බැලීමේ දී අධ්‍යාපනයේ උසස්තම නිෂ්ටාව වන්නේ, මිනිසා සතු අසීමිත චින්තන හැකියාව උපයෝගී කර ගනිමින් ඔහුට මෙලොව සුවදායක ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය පරිසරය ගොඩ නැගීමයි. මෙම ප්‍රයත්නයේ දී මිනිසා පිළිබඳ ගැටලුව ගවේෂණය කිරීම අත්‍යවශ්‍යය. මිනිසා සතු අසීමිත චින්තන හැකියාවේ ප්‍රබලතා අර්ථවත් අයුරින් හඳුනා ගැනීම එකී ප්‍රයත්නයේ ප්‍රධාන අපේක්ෂාවයි. මෙහි පළමුවන පරිච්ජේදයෙන්

මිනිස් සිතේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අවධානය යොමු කරමින් මිනිසා සතු අසීමිත චින්තන හැකියාවේ ප්‍රබලතාව බුදු දහම ඇසුරින් විස්තර කෙරේ.

මිනිසෙකු විසින් ලගා කර ගත හැකි උස්සතම ප්‍රාප්තිය රහත් බවයි. බුදු වීම සුවිශේෂ තත්ත්වයකි. රහත් බව අවබෝධ කර ගැනීම දක්වා දක්වා මානව චින්තන හැකියාව වර්ධනය කර ගැනීම තුලින් අර්ථවත් වන්නේ මිනිස් සිරුරේ ආකෘතිමය ස්වභාවය පරිපූර්ණ වශයෙන් අවබෝධ කර ගැනීම තුලින් සමස්ත විශ්වමය ශක්ති පදාර්ථයන්හි යථා ස්වභාවය අවබෝධ කර ගත් බවයි. ස්කන්ධ පංචකයකින් සමන්විත මිනිස් සිරුර පිළිබඳ ව ලබන පූර්ණ අවබෝධය සමස්ත විශ්වය ම අවබෝධ කර ගැනීමකි. මෙ නිසා බුදු දහම ප්‍රකට කරන මිනිසා පිළිබඳ සංකල්පයේ දාර්ශනික පදනම විමසා බැලීම අත්‍යවශ්‍යය. සංශ්ලේෂණ ක්‍රමය හා විශ්ලේෂණ ක්‍රමය පාදක කර ගනිමින් බුදු දහම මිනිසා පිළිබඳ සංකල්පයේ දාර්ශනික පදනම විවරණය කරන අයුරු මෙහි දෙවන පරිච්ඡේදයෙන් විස්තර කෙරේ.

මිනිසා වෙනස් කළ හැකි සත්වයෙකි. වෙනස්වීම විශ්ව සාධාරණ ලක්ෂණයකි. මිනිසා පිළිබඳ බෞද්ධ සංකල්පයේ දාර්ශනික අර්ථ විග්‍රහය ද වෙනස්වීම හෙවත් අනිත්‍යයයි. වෙනස් වීම ස්වාභාවික සංසිද්ධියකි. අර්ථවත් සංවර්ධයක් අපේක්ෂා කරන මිනිසා වෙනස් කිරීමක් කළ යුතුය. අධ්‍යාපන සංවර්ධනයේ මූලික පිළිගැනීමක් වන 'සමාජ සචලතාව' අර්ථවත් කර ගත හැක්කේ ද වෙනස් කිරීමේ මූල ධර්මය මත පිහිටා ක්‍රියා කිරීමෙනි. වෙනස් කිරීම සිදු විය යුත්තේ අනු පිළිවෙල ප්‍රතිපදාවකටය. බෞද්ධ අධ්‍යාපනය, මිනිසා විසින් අවබෝධ කර ගත හැකි උසස්තම සත්‍යය වන නිවන් සාක්ෂාත් කර ගැනීම දක්වා මිනිස් සිත පියවරෙන් පියවර වෙනස් කර ගත යුතු අයුරු විවරණය කරයි. නිතර වෙනස් වන සිත අපේක්ෂිත උසස්තම පරමාර්ථය ඉටු කර ගන්නා තුරු පාලනයකින් යුතුව මෙහෙය විය යුතු ආකාරය බෞද්ධ අධ්‍යාපනයෙන් විවරණය වේ. මෙහි තෙවන පරිච්ඡේදයෙන් විස්තර වන්නේ මිනිස් සිතේ ගතික ස්වභාවය සහ උසස්තම ප්‍රාප්තිය වන නිවන අවබෝධ කර ගැනීම සඳහා පියවරෙන් පියවර වර්ධනය කර ගනිමින් සිත පාලනය පිළිබඳ අනුපිළිවෙල ප්‍රතිපදාව පැහැදිලි කිරීමට ය.

University of Colombo Library

මිනිසාගේ පරම ප්‍රාප්තිය වන නිවන අවබෝධ කර ගැනීම සඳහා අනුපිළිවෙල ප්‍රතිපදාවක් බෞද්ධ අධ්‍යාපනයෙන් සවිස්තර ව පැහැදිලි කර ඇතත්, මිනිසාගේ මෙලොව සුබ විහරණය සඳහා ප්‍රමාණවත් මග පෙන්වීමක් කර නැතැයි කෙනෙකු තුළ සැකයක් ඇති විය හැකිය. බුදු දහම පිළිබඳ පොත පත පළ කල ඇතැම් උගත්හු, බුදු දහම මිනිසාගේ ලෝකෝත්තර සංවර්ධනය උදෙසා උපයෝගි කර ගත හැකි දහමක් මිස ඔහුගේ භෞතික සංවර්ධනය උදෙසා ඉවහල් කර ගත නො හැකි දහමක් යයි ප්‍රකාශ කරති. බුදු දහම සංවර්ධනය සංකල්පය අර්ථ දක්වන්නේ සීමිත විෂය ක්ෂේත්‍රයක නො පිහිටා පුළුල් දෘෂ්ටි කෝණයකිනි. උචිත භෞතික සංවර්ධනයකින් පරිබාහිර ව ලෝකෝත්තරමය අභිවර්ධනයක් ලඟා කර ගත නො හැකි බව බුදු දහම අවධාරණය කරයි. මිනිසා ලෞකික වශයෙන් සංවර්ධනය විය යුතු උචිතතම ක්‍රියා පිළිවෙත බෞද්ධ ඉගැන්වීම්වලින් අණාවරණය වෙ. බුදු දහම මිනිසාගේ ලෞකික වූත් ලෝකෝත්තර වූත් සංවර්ධනය විස්තර කරන්නේ සාධාරණ බවේ මූල ධර්මය පදනම් කරගෙනය. මෙහි සිවු වන පරිච්ඡේදයෙන් මූලික බුදු සමයේ ඉගැන්වීම් අනුව මිනිසාගේ භෞතික සංවර්ධනය අර්ථවත් කර ගත යුතු ආකාරය විස්තර කෙරේ.

භෞතික වූත් ආධ්‍යාත්මික වූත් සංවර්ධනයේ පරිපූර්ණත්වය උදෙසා මිනිසා විසින් අනුගමනය කළ යුතු පරිපූර්ණ අධ්‍යාපන ක්‍රියාවලියක් බුදු දහම අනාවරණය කරයි. සංවර්ධනය උදෙසා මිනිසා යොමු කිරීමේ දී අධ්‍යාපනමය වශයෙන් අවධාරණය විය යුතු මූලිකාංග රාශියකි. ඒ එක් එක් මූලිකාංගය ඔස්සේ උභයාර්ථ සංවර්ධනය ම සලසා ගත යුත්තේ මිනිසා විසින් ම ය. බුදු දහම අවධාරණය කරන අධ්‍යාපන ~~ක්‍රියාවලියේ ස්වරූපය~~, ප්‍රායෝගික බව සහ ක්‍රියාකාරී අවස්ථාවෙ තමා සහ විෂය ලෝකය අවබෝධ කර ගත යුතු ආකාරය පිළිබඳ ව මෙහි පස්වන පරිච්ඡේදයෙන් විස්තර කෙරේ.

මිනිසා ගතික සත්වයෙකි. බෞද්ධ අධ්‍යාපනයේ සංවර්ධන ක්‍රියාවලියෙන් ප්‍රකට වන්නේ ද මෙම විශ්ව සත්‍යයයි. මානව චර්යාව හිතකර අයුරින් සංවර්ධනය කිරීමට තම මෙම විශ්ව සත්‍යය අවබෝධ කර දීම අත්‍යවශ්‍යය. මේ සඳහා නිවැරදි ම මාර්ගය අධ්‍යාපනයයි. මිනිසාට විශ්වයේ හිමි තැනත්, තම අනිවාර්ය කාර්ය භාරයත් පිළිබඳ ව

ගැඹුරින් විග්‍රහ කෙරෙන අධ්‍යාපන ක්‍රියාවලියක අවශ්‍යතාව කැපී පෙනේ. වර්තමාන තරඟකාරී අධ්‍යාපන රටාව තුළ මිනිසුන් ඥාන කෝෂ්ඨාගාර ලෙස ක්‍රියා කරනු විනා ඔවුන්ගේ භෞතික වුත් ආධ්‍යාත්මික වුත් සංවර්ධනයේ සමබරතාවක් දක්නට නො ලැබේ. නිරන්තර තරගය, මානවයාගේ අනාගත පැවැත්ම නිශ්චිත අවදානමකට ලක් කරනු ලැබ තිබේ.

බෞද්ධ අධ්‍යාපනයේ පදනම කාරුණික බවයි. මිනිසාගේ සමබර පෞරුෂ වර්ධනය තුළින් සාමකාමී ප්‍රබුද්ධ ලෝකයක් ගොඩ නගා ගැනීමේ නිරවද්‍ය ක්‍රියා පිළිවෙත ඉදිරිපත් කරනු ලබන්නේ බුදු දහම විසින් පමණක් බව නිගමනය කළ හැකිය. වර්තමාන තරඟකාරී අධ්‍යාපන ක්‍රමය වෙනුවට මිනියත් බව හා සාමය අගයන සක්‍රිය අධ්‍යාපන ක්‍රමයක් සඳහා බෞද්ධ අධ්‍යාපන ක්‍රියාවලිය යොදා ගත හැකි ආකාරය පිළිබඳ යෝජනා කිපයක් මෙහි සයවන පරිච්ඡේදයෙන් විස්තර කෙරේ.

*****